# රස ප්‍රතිතීයෙහි ලා පැරකුම්බා සිරිත් කවියා මාධුර්ය ගුණය උපයුක්ත කොටගැනීම පිළිබඳ විමසුමක්

එච්. බී. යසරත්න[1]

සියබස්ලකරෙහි දැක්වෙන කාව්‍යය ගුණ අතර දෙ වැනි ගුණය වන මාධුර්ය ගුණය හෙවත් මියුරු ප්‍රාණය යනුවෙන් පිළිබිඹු වනුයේ කාව්‍යයක ශබ්දය හා අර්ථය පිළිබඳ විචිත්‍ර බව යි. එහි දී ශබ්ද මාධුර්යය සඳහා අනුප්‍රාසවත් අක්ෂර හා පද භාවිත කිරීම නිසා ඇති වන ශ්‍රැත්‍යනුප්‍රාසය ශබ්ද රසය නංවයි. මෙලෙස ශබ්ද ගුණ ගැන්වීමෙන් කාව්‍ය අලංකාරවත් වනවා සේ ම කාව්‍යයේ මුඛ්‍ය තේමාවට උචිත අර්ථවත් පද යොදා අර්ථ ගුණ ගැන්වීම නිසා කාව්‍යයේ හරවත් බව ඔප් නැංවේ. ශබ්ද මාධුර්යය ඇති කරනු වස් යොදන පද නිසා අර්ථයට හානි සිදු වේ නම් කාව්‍යයේ සැබෑ මධුර බව ඉන් පිළිබිඹු නො වනු ඇත. මෙලෙසින් මියුරු ප්‍රාණය කුළුගන්වමින් සිංහල සාහිත්‍යයෙහි රචිත කාව්‍යයන්හි ශබ්ද හා අර්ථ රසය බිඳ හෙළාගත් අවස්ථා ද හමු වේ. ඒ අතර කෝට්ටේ යුගයේ සිවු වැනි පැරකුම්බා රජු උදෙසා ලියවුණු ප්‍රශස්ති කාව්‍යයක් වන පැරකුම්බා සිරිත ශබ්ද රසයෙන් අනූන කාව්‍ය නිර්මාණයක් ලෙස විද්වත් පැසසුමට ලක් වන හෙයින් එය අර්ථ මාධුර්යයෙන් ද යුක්ත වන්නේ දැ යි විමසා බැලීම මේ පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ යි. එහි දී ඇසුරු කෙරුණු ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍යික මූලාශ්‍රය මඟින් හෙළි වූ පරිදි පැරකුම්බා සිරිත්කරු ප්‍රතාපවත් රාජ පෞරුෂයක් ගොඩනැංවීම සඳහා වඩාත් යෝග්‍ය කාව්‍යාත්මක භාෂාවක් යොදා ගත් බව පැහැදිලි විය. ල’කාර, ඩ’කාර, ද’කාර, ර’කාර බහුල ව අනුප්‍රාසයේ යොදමින් රජුගේ ශෘංගාරාත්මක බව, එඩිතර රණකාමීත්වය ප්‍රකට කෙරෙන අතර මෙකී හැම අවස්ථාවක දී ම යොදාගෙන ඇති ශ්‍රැත්‍යනුප්‍රාස අක්ෂර හා පද සියල්ල ම වාගේ හුදු ශබ්දාඩම්බරය පමණක් රැගත් ඒවා නො ව අර්ථ රසය ද තීව්‍ර කරන යෙදුම් බව පැහැදිලි ය. පර්යේෂණයෙන් අනාවරණය වූ කරුණු සලකාබැලීමේ දී රචනයෙන් ගාඪත්වය, ශිථිලත්වය, ශබ්ද සමතාව,  රචනයේ ක්‍රමික ආරෝහණය, දීර්ඝ සමාසයෙන් තොර වීම, කඨෝර නො වීම ආදි වූ ශබ්ද මාධුර්යවත් යෙදීම් ද අර්ථයාගේ ප්‍රෞඪත්වය, නිර්මලත්වය, විවිධාර්ථය, සුගම බව, පරුෂාර්ථ නො වීම, අග්‍රාම්‍ය බව ආදි වූ අර්ථ මාධුර්යවත් යෙදීම් ද භාවිතය නිසා පැරකුම්බා සිරිත ශබ්දාර්ථ සුසංයෝගවත් මාධුර්ය ගුණය මැනවින් පිළිබිඹු කරන උසස් කාව්‍ය නිර්මාණයක් ලෙස අර්ථ දැක්විය හැකි ය.

**ප්‍රමුඛ පද:** සියබස්ලකර, මාධුර්ය ගුණය, ශ්‍රැත්‍යනුප්‍රාසය, සු වැනි පැරකුම්බා, ශිථිලත්වය

[1] සිංහල අධ්‍යයනාංශය